නිපුණතා මට්ටම 4.3 - සුළු මුදල් ගෙවීම් හා බැඳි ගනුදෙනු සටහන් කිරීමට සුළු මුදල් ගෙවීම් ජ'නලය පවත්වා ගනියි.

**<u>සුළු මුදල් ගෙවීම් ජ'නලය</u>** - ව්‍යාපාරවල සාපේක්ෂව අඩු වටිනාකම් සහිත වියදම් ගෙවීම් සටහන් කිරීම සඳහා සුළු මුදල් ගෙවීම් ජ'නලය භාවිත කරයි.

**<u>සුළු මුදල් ජ'නල් වවුචරය</u>** - සුළු මුදල් ගෙවීම්,සුළු මුදල් ගෙවීම් ජ'නලයේ සටහන් කරන්නේ සුළු මුදල් ජ'නල් වවුචරය නැමති මූලාශ්‍ර ලේඛනය යොදා ගෙනය.

**<u>සුළු මුදල් අග්‍රිම ක්‍රමය</u>** - ඉදිරි මාසයක් වැනි කෙටි කාලයක් තුළ සුළු මුදල් සඳහා වැය වේ යැයි අපේක්ෂිත යම් මුදලක් ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරු වෙත ලබා දීම සුළු මුදල් අග්‍රිම ක්‍රමය ලෙස හඳුන්වයි.

**<u>සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය</u>** - කාලච්ඡේදය අවසානයේදී සුළු මුදල් භාරකරු විසින් වියදම් කළ ප්‍රමාණයට සමාන මුදලක් නැවත ප්‍රධාන මුදල් භාරකරු විසින් ලබා ගැනීම අග්‍රිමය ප්‍රතිපූර්ණය ලෙස හඳුන්වයි.

**<u>සුළු මුදල් ගෙවීම් ජ'නලයක ආකෘතිය -</u>**

සුළු මුදල් ගෙවීම් ජ'නලය

| දිනය | විස්තරය | ව.අංකය | ගෙවීම් රු. | විශ්ලේෂණ තීරු | | | | වෙනත් රු. | ලෙ.පි. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ලිපිද්‍රව්‍ය | කුලී වියදම් | ගමන් වියදම් | විවිධ වියදම් | | |
| | | | | | | | | | |

## <u>සුළු මුදල් ගෙවීම් ජ'නලය හා පොදු ලෙජරයේ සටහන් කරන ගනුදෙනුවලට අදාළ ද්විත්ව සටහන්</u>

1.සුළු මුදල් අග්‍රිම ක්‍රමය ලැබීම

සුළු මුදල් ගිණුම හර

මුදල් ගිණුම බැර

2.සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම

සුළු මුදල් ගිණුම හර

මුදල් ගිණුම බැර

3.සුළු වියදම් තීරුවල එකතුව

ඒ ඒ වියදම් තීරු හර

සුළු මුදල් ගිණුම බැර

**<u>අභ්‍යාස</u>**

1.සුළු මුදල් අග්‍රිම ලැබීම හා සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම කෙටියෙන් පැහැදිලි කරන්න.

2.ව්‍යාපාරයක මාසික සුළු මුදල් අග්‍රිමය රු.3,000කි.එම මාසය තුළදී කළ සුළු මුදල් වියදම්වල එකතුව රු.2,700කි.අග්‍රිමය ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කීයද?